**මගේ අංකය : සී.ප්‍රා.ස /1/5/2018,**

**සීතාවක ප්‍රාදේශීය සභාව,**

**හංවැල්ල.**

**2018.11.03.**

**සීතාවක ප්‍රාදේශීය සභාවේ,**

**ගරු සභාපති/උප සභාපති/ මන්ත්‍රී,**

**...............................................................................**

**මැතිතුමනි / මැතිතුමියනි,**

**<u>2018 නොවැම්බර් මස මහා සභා රැස්වීම – 08 වන මහා සභාව.</u>**

**සීතාවක ප්‍රාදේශීය සභාවේ 2018 නොවැම්බර් මාසයට නියමිත 08 වන මහා සභා රැස්වීම 2018 නොවැම්බර් මස 12 වන සඳුදා දින, පෙ.ව. 10.00 ට සීතාවක ප්‍රාදේශීය සභාවේ සභා ශාලාවේ දී පැවැත්වේ.**

**එදිනට ඔබතුමාගේ / ඔබතුමියගේ පැමිණීම ගෞරවයෙන් බලාපොරොත්තු වෙමි.**

**මෙයට,**

**ගරු සභාපතිතුමාගේ නියමය පරිදි,**

**කේ.ඒ. චන්දන පද්මසිරි,**
**ලේකම්,**
**සීතාවක ප්‍රාදේශීය සභාව,**
**හංවැල්ල.**

**<u>න්‍යාය පත්‍රය.</u>**

**01.** පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කර ගැනීම.

**02.** සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

**03.** ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරිම.

**04.** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.

<u>04 – (01) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන සූරියආරච්චි මැතිතුමා විසින් ඉදිරිපත් කරයි.</u>

01. තාවල්ගොඩ ග්‍රාම නිලධාරි වසමට අයත් කොස්ගම විලේජ් නේවාසික භූමි කලාපයේත් අධි බලැති විදුලි ධාරිතාවයක් සහිතව පොලිතින් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යන්නේ බව දන්නේද?

02. නේවාසික ඉඩම් හරහා එවැනි විදුලි ධාරිතාවයක් සහිත විදුලි රැහැන් ඇදීමෙන් නේවාසිකයන් සිදුවී හැකි අවදානම හා ගස් කොළන් ඉවත් කිරීමට සිදුවීම සම්බන්ධයෙන් නේවාසිකයන් ලිඛිත ලබා දී ඇති විරෝධතාවය සඳහා ගෙන ඇති පියවර මොනවාද?

03. 2003 – 2004 වැනි කාල වල ගෘහ ආශ්‍රිත කර්මාන්තයක්ව පැවති ඉහත කර්මාන්තය මහා පරිමාණ කර්මාන්තයක් බවට පත් කිරීමේදී ප්‍රාදේශීය සභාව මගින් ලබා ගත යුතු පිළිගත් හා විධිමත් අවසරපත් ක්‍රමානුකූලව ලබාගෙන ඇද්ද? ලබා ගෙන ඇත්නම් ඒවා මොනවාද? ඒවා නිකුත් කර ඇති දින වකවානු වෙන් වෙන්ව ඉදිරිපත් කරන්න.

04. හංවැල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිගේ අත්සන සහිතව මහජන සෞඛ්‍ය පරික්ෂක කේ.පී. සුනිල් මයුරතිස්ස මහතා විසින් සභාපති, සීතාවක වෙත 2004.08.20 දිනැති යොමු කර ඇති ප්‍රාදේශීය සභාව 2004.09.02 දින මුද්‍රාව සහිත ලිපියේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පියවර ගත්තේද? එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග මොනවාද? අදාල නිර්දේශ හෝ නියෝග අනුගමනය නොකළේ නම් අදාල හිමිකරු සම්බන්ධයෙන් ගෙන ඇති විධිමත් නීතිමය පියවර මොනවාද?

05. එවකට සීතාවක ප්‍රාදේශීය සභාව පරිසර කමිටුවේ ගරු සභාපති සහිතව 2012.02.23 දින පරිසර අමාත්‍යාංශ ලේකම්වරයා විසින් සිදු කරන ලද පරීක්ෂණ වාර්තාව 2012.03.06 දින නිකුත් කර ඇති අතර එම වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට එවකට සභාව මගින් පියවර ගෙන ඇත්ද? ඒ මොනවාද? අදාළ නිර්දේශ කර්මාන්ත හිමියා විසින් අනුගමනය නොකළේ නම් එවකට ගෙන ඇති විධිමත් නීතිමය පියවර මොනවාද?

06. කර්මාන්ත භූමිය වාණිජ කටයුතු සඳහා අනුමත නොකර, අනුමත ගොඩනැගිලි සැලසුමක් නොමැතිව, පරිසර ආරක්ෂණ බලපත්‍ර නොමැතිව, සහා වෙළඳ බලපත්‍ර නොමැතිව රටේ මූලික නීති හා පරිසර නීති උල්ලංඝනය කරමින් මෙවැනි කර්මාන්තයක් මේ ආකාරයෙන් පවත්වාගෙන යාමට තවදුරටත් අවසර ලබා දෙනවාද? එසේ නොමැති නම් ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග මොනවාද?

07. මෙවැනි බලපත්‍ර රහිත කර්මාන්ත ශාලාවක් මෙතෙක් දුර පවත්වාගෙන ඒම සඳහා ඉඩකඩ ලැබී තිබුණු හේතු දැන ගැනීම තොරතුරු දැන ගැනීමේ අයිතිය අනුව ජනතාව සතු මූලික අයිතියක් වන බැවින් ඒ පිළිබඳව වන හේතු මොනවාද යන්න සභාවට ඉදිරිපත් කළ හැකිද? ඒ මොනවාද?

**05.** යථා පරිදි කල් දී ඇති යෝජනා.

05 – (01) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දනුෂ්කි ප්‍රභානි අල්මේදා මැතිතුමිය විසින් යෝජනා කරයි.

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර හේවාගම් කෝරළයේ සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 443/ඒ ඉහළ හංවැල්ල ග්‍රාම නිලධාරි වසමේ අංක 537 නිවසේ පදිංචි සංකපාල ආචාරිගේ අමරදාස යන තැගි දීමනාකාර පක්ෂයේ යැයි කියනු ලබන අය එම කොට්ඨාසයේ පිහිටි මීගහවත්තේ කැබෙල්ලය කියන ඉඩමට මායිම්, උතුරට වෙල ද, නැගෙනහිරට මෙම ඉඩමේ කැබෙල්ලක් වෙන් වූ පැල ඉනිවැට ද, දකුණට කුළුපන බඩල්ගේ ජෝන්ට සහ තවත් අයට අයිති මෙම ඉඩමේ කැබැල්ලද, බස්නාහිරට ලියනවඩුගේ ලූස්හාමිට අයිති මෙම ඉඩමේ කැබැල්ලද, මායිම් වූ අක්කර භාගයක් පමණ විශාල ඉඩමෙන් උතුරු මායිම් පැත්තට වන සේ නොබෙදූ පර්චස් 20 ක් විශාල බිම් ප්‍රමාණයක් යොදා සුසාන භූමියක් සඳහා ප්‍රයෝජන ගැනීම පිණිස අංක 3808 දරණ තැගි ඔප්පුව ප්‍රකාර සීතාවක ප්‍රාදේශීය සභාව වෙත වර්ෂ 1994 මැයි 30 වන දින තැගි කරන ලද්දේ මොහු මානසික ආබාධයකින් පෙළෙමින් පසු වන විටකදී වෙනත් අයෙකුගේ පෙළඹවීමක් නිසා එය පවරා දී මෙතෙක් කල් ගත වන තුරුත් එහි කිසිදු මිනියක් භූමිදාන නොකිරිමත්, ඉඩම වටා පදිංචිකරුවන් බොහොමයක් සිටිමත්, ඉඩම මුළුමනින් වතුරට යට වීමත්, මෙය පවරා දුන් පුද්ගලයාට දරුවන් දෙපළක් සිටින බවත්, ඔවුන්ට වෙනත් දේපළක් නොමැති අසරණභාවයෙන් පෙළෙන බැවිනුත් මෙම දේපළ නැවත ඔවුන්ගේ ඉල්ලීම ප්‍රකාරවත් 2009.10.13 වන දින "ප්‍රාදේශීය සභාවට පවරා දී ඇති ඉඩම ආපසු ලබා ගැනීම" යන හිසින් යුතුව පළාත් පාලන කොමසාරිස්තුමා විසින් එවන ලද ලිපිය හා 2017.09.06 දිනැති පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ අතිරේක ලේකම්තුමා විසින් නිකුත් කරන ලද ලිපිය ප්‍රකාරව පරික්ෂා කර බලා මෙම දේපළ නැවත ඉල්ලුම්කාර පාර්ශවය වෙත ලබා දීම සුදුසු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

මීට අදාල ලිපි ලේඛන යෝජනාවට අමුණා ඇති අතර අවශ්‍ය කටයුතු කිරිම සඳහා මෙහි පිටපත් පළාත් පාලන කොමසාරිස්, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ අතිරේක ලේකම්, පළාත් සභා මන්ත්‍රී ගරු මහේෂ් අල්මේදා මැතිතුමන්ට හා අදාල ඉල්ලුම්කරුට යැවීම කළ යුතු යැයිද තවදුරටත් මම යෝජනා කරමි.

05 – (02) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.

2018.05.11 වන දින පැවති මහා සභාවේ තීරණ අංක 05 (06) යටතේ මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව මා වෙත ගෙවීම් කිරිමට පවරන ලද බලය අනුව මා විසින් කරන ලද පහත උප ලේඛනයේ විස්තර කරන්නට යෙදී ඇති ගෙවීම් ඊට අනුරූපිව ඇති ගෙවීම් ලබන්නා වෙත ඊට ඉදිරියෙන් දක්වා ඇති මුදල ගෙවීම අනුමත කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංක | වවුචර් අංකය හා දිනය | විස්තරය | මුදල රු. |
|---|---|---|---|
| 01 | **2138 - 2142** 2018.10.09 | 2018 සැප්තැම්බර් මස ප්‍රධාන කාර්යාලයේ, පාදුක්ක උප කාර්යාලයේ, කොස්ගම උප කාර්යාලයේ, හංවැල්ල උප කාර්යාලයේ හා කහහේන උප කාර්යාලයේ මාර්ග, සෞඛ්‍ය, ආයුර්වේද, පුස්තකාල හා ව්‍යාපෘති අංශයන්හි සේවයේ නියුතු ආදේශක සේවකයින් 98 දෙනෙකු වෙනුවෙන් දෛනික වැටුප් ගෙවීම. | 2,327,201.02 |
| 02 | **2313 – 2317** 2018.10.23 | 2018 ඔක්තෝම්බර් මස ප්‍රධාන කාර්යාලයේ, පාදුක්ක උප කාර්යාලයේ, කොස්ගම උප කාර්යාලයේ, හංවැල්ල උප කාර්යාලයේ හා කහහේන උප කාර්යාලයේ සේවයේ නියුතු ස්ථිර විශ්‍රාම වැටුප් සහිත සේවකයින් 187 දෙනෙකු සඳහා වැටුප් ගෙවීම. | 6,487,620.13 |

05 – (03) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.

සීතාවක ප්‍රාදේශීය සභාවේ හංවැල්ල උප කාර්යාලයේ කළමනාකරණ සහකාර 111 තනතුරේ සේවය කරන එච්.පී.එල්. ඉරේෂා මහත්මිය මහජන බැංකුවේ කිරිදිවැල ශාඛාව මගින් ලබා ගැනීමට නියමිත දේපල ණය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපූර්ණය කළ යුතු පොලි මුදල, මෙම සභාවට ප්‍රතිපූර්ණය කරන තෙක් එම පොලි මුදල සභා අරමුදල් මගින් මහජන බැංකුවේ කිරිදිවැල ශාඛාව වෙත ගෙවිය යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>05 – (04) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.</u>**

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කළ යුතු පහත උප ලේඛනයේ විස්තර කරන්නට යෙදී ඇති ව්‍යාපෘති ඊට අනුරූපිව ඇති කොන්ත්‍රාත් සමිති/ ආයතන/ පුද්ගලයින් සමග ඊට ඉදිරියේ දක්වා ඇති ගිවිසුම් ගත මුදල අනුව ගිවිස ගනිමින් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංක | ව්‍යාපෘතිය | මුල්‍ය සම්පාදනය | කොන්ත්‍රාත් සමිතිය/ ආයතනය/ පුද්ගලයා | ගිවිසුම්ගත මුදල රු. |
|---|---|---|---|---|
| **01** | හංවැල්ල හා පාදුක්ක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල හා එක්ව සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ආවරණය වන පරිදි බෝ නොවන රෝග හඳුනා ගැනීමේ වෛද්‍ය සායන 02 ක් පැවැත්වීම සඳහා වන වැය ඇස්තමේන්තුව. | සභා අරමුදල් | සරජ්, ප්‍රධාන කාර්යාලය, ආර්.පී.එන්.පී. ජිනදාස මයා. | **255,000.00** |
| **02** | 2018 දෙසැම්බර් මස පැවැත්වීමට නියමිත සීතාවක ප්‍රාදේශීය සභා පෙර පාසල් දරු දැරියන්ගේ විවිධ ප්‍රසංගය සඳහා වන වැය ඇස්තමේන්තුව. | සභා අරමුදල් | සරජ්, ප්‍රධාන කාර්යාලය, ආර්.පී.එන්.පී. ජිනදාස මයා. | **585,000.00** |
| **03** | 2018 දෙසැම්බර් මස පැවැත්වීමට නියමිත පුස්තකාල පාඨකයින්ගේ හා සීතාවක ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලයේ ගායන හා නර්තන හැකියාවන් ඔප් නංවන "සීතාවක ප්‍රතිභා ගී සරණිය" සංගීත වැඩසටහන සඳහා වන වැය ඇස්තමේන්තුව. | සභා අරමුදල් | සරජ්, ප්‍රධාන කාර්යාලය, ආර්.පී.එන්.පී. ජිනදාස මයා. | **305,000.00** |
| **04** | සීතාවක ප්‍රාදේශීය සභාවේ සනීපාරක්ෂක හා මාර්ග අංශයේ සේවය කරන ලද සේවකයින් වෙනුවෙන් පැවැත්වීමට නියමිත වෛද්‍ය සායනය සඳහා වන වැය ඇස්තමේන්තුව. | සභා අරමුදල් | සරජ්, ප්‍රධාන කාර්යාලය, ආර්.පී.එන්.පී. ජිනදාස මයා. | **199,500.00** |
| **05** | සභාව සතු ZA – 9257 කම්පැක්ටරය සේවා කිරිම වෙනුවෙන් වු ඇස්තමේන්තුව | සභා අරමුදල් | හවල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම, 245/47, පරණ අවිස්සාවේල්ල පාර, ඔරුගොඩවත්ත, | **8,254.70** |
| **06** | සභාව සතු ZA – 9257 කම්පැක්ටරය සේවා කිරිම වෙනුවෙන් වු ඇස්තමේන්තුව | සභා අරමුදල් | හවල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම, 245/47, පරණ අවිස්සාවේල්ල පාර, ඔරුගොඩවත්ත, | **33,154.50** |
| **07** | කොස්ගම සතිපොළ රෙදිකඩ තැනීම. | සභා අරමුදල් | සභාපති, 427, පහළ කොස්ගම කැළණි | **1,412,197.12** |

| | | | | |
|---|---|---|---|---|
| | | | මිටියාවත ග්‍රාම සංවර්ධන සමිතිය. | |
| 08 | හංවැල්ල නගරය පොදු වැසිකිලිය ඉතිරි අළුත්වැඩියාවන් කිරිම. | සභා අරමුදල් | සභාපති, 443/බී, හංවැල්ල නගරය ග්‍රාම සංවර්ධන සමිතිය. | 80,289.00 |
| 09 | කොස්ගම සතිපොළ භූමියේ ඇති වැසිකිලිය නවීකරණය කිරිම. | සභා අරමුදල් | සභාපති, 427, පහළ කොස්ගම කැළණි මිටියාවත ග්‍රාම සංවර්ධන සමිතිය. | 169,644.90 |
| 10 | අළුත්හේන පාර සංවර්ධනය කිරිම. | සභා අරමුදල් | සභාපති, කැළණි නදී වැඩිහිටි සංවිධානය, කහටපිටිය. | 156,893.68 |
| 11 | කොස්ගම උප කාර්යාල ගොඩනැගිල්ල 20 × 10 කාමරයක් සම්බන්ධ කිරිම. | සභා අරමුදල් | සභාපති, 427, පහළ කොස්ගම කැළණි මිටියාවත ග්‍රාම සංවර්ධන සමිතිය. | 533,957.67 |
| 12 | කහහේන පුස්තකාලය පෙර පාසල හා මාතෘ සායනය සඳහා වෙනම ප්‍රවේශ මාර්ගයක් වෙන් කිරිම සඳහා දැල් ආවරණ වැටක් සෑදිම. | සභා අරමුදල් | සභාපති, ග්‍රාම සංවර්ධන සමිතිය, කහහේන. | 203,034.45 |
| 13 | සීතාවක ප්‍රාදේශීය සභාවේ විදුලි අංශය සඳහා ආවරණයක් තැනීම. ( වැඩ කුලිය පමණක් සහිතයි.) | සභා අරමුදල් | සභාපති, 443/බී, හංවැල්ල නගරය ග්‍රාම සංවර්ධන සමිතිය. | 506,657.70 |
| 14 | අළුත් අම්බලම කනිෂ්ඨ විද්‍යාල පාර සංවර්ධනය කිරිම. | විමධ්‍යගත අයවැය | සෘජු ශ්‍රමික | 193,677.47 |
| 15 | කහටපිටිය පුළුන්ගහවත්ත පාර සංවර්ධනය කිරිම. | සභා අරමුදල් | සභාපති, කැළණි නදී වැඩිහිටි සංවිධානය, කහටපිටිය. | 81,116.97 |
| 16 | රණසිංහාරාමය පාර සංවර්ධනය කිරිම. | සභා අරමුදල් | සභාපති, 428/ඒ, අළුත් අම්බලම ග්‍රාම සංවර්ධන සමිතිය. | 223,899.44 |
| 17 | හංවැල්ල මධ්‍ය විද්‍යාල මාවත අතුරු පාර 1 තාර දමා සංවර්ධනය කිරිම. | සභා අරමුදල් | සභාපති, 443/ඒ, පහත්ගම ග්‍රාම සංවර්ධන සමිතිය. | 257,131.81 |
| 18 | පාදුක්ක මීපෙ ප්‍රධාන මාර්ගයට මුහුණලා කොටිගල හේන මාර්ගය සංවර්ධනය කිරිම. (2018.10.10 දින මහා සභාවේ 05 – (27) - 04 තීරණයේ සඳහන් කොන්ත්‍රාත් සමිතිය සංශෝධනය කිරිම) | ග්‍රාමීය මාර්ග 1000 km වැඩසටහන | සභාපති, ගලගෙදර නැගෙනහිර ග්‍රාම සංවර්ධන සමිතිය. | 844,827.03 |
| 19 | නිරිපොල දෙහිගහහේන අතුරු මාර්ගය සංවර්ධනය කිරිම. (2018.10.10 දින මහා සභාවේ 05 – (27) - 19 තීරණයේ සඳහන් කොන්ත්‍රාත් සමිතිය සංශෝධනය කිරිම) | ග්‍රාමීය මාර්ග 1000 km වැඩසටහන | සභාපති, ලෙව්කේ ගොවි සංවිධානය, නිරිපොල. | 646,404.44 |

| | | | | |
|---|---|---|---|---|
| **20** | කොස්ගම ධර්මග්‍රාමය පාරේ පාලම් ඇදි වැටක් සකස් කිරිම. | සභා අරමුදල් | සභාපති, ස්වශක්ති ගොවි සංවිධානය, මුරුතගම. | **55,070.00** |
| **21** | දිද්දෙණිය කම්මල්වත්ත පාර පාලම අසල අතුරු මාර්ගය ආරම්භ වන ස්ථානයේ කොන්ක්‍රිට් කාණුව තැනීම. | සභා අරමුදල් | සභාපති, දිද්දෙණිය දකුණ ග්‍රාම සංවර්ධන සමිතිය. | **98,698.63** |
| **22** | හංවැල්ල උත්සව ශාලාව ඉහළ ජල ටැංකිය රඳවා ආධාරකය තැනීම. | සභා අරමුදල් | සභාපති, **443/**බී, හංවැල්ල නගරය ග්‍රාම සංවර්ධන සමිතිය. | **14,582.90** |
| **23** | කහහේන පුස්තකාලයේ පුස්තකාලයාධිපති කාමරය වෙන් කිරිම, පුවත්පත් ගබඩා කාමරය වෙන් කිරිම ඇතුළු අළුත්වැඩියා කටයුතු | සභා අරමුදල් | සභාපති, ග්‍රාම සංවර්ධන සමිතිය, කහහේන. | **103,156.98** |
| **24** | කහහේන වෙළඳ සංකිර්ණයේ ගොඩනැගිල්ලේ තරප්පුවට කොටස ආවරණය කිරිම හා ආරක්ෂිත ගේට්ටුව යෙදීම. | සභා අරමුදල් | සභාපති, ග්‍රාම සංවර්ධන සමිතිය, කහහේන. | **65,126.00** |
| **25** | පහත්ගම හීන් ඇල කුඹුර හරස් පාර ( බෝධිය පාර) ඉතිරි කොටස සහ ගල්මුල්ල පාර කොටසක් තාර දමා සංවර්ධනය කිරිම. | සභා අරමුදල් | සභාපති, ඉහළ හංවැල්ල දකුණ ග්‍රම සංවර්ධන සමිතිය. | **339,449.96** |

<u>**05 – (05)** ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.</u>

**2018** අයවැය ලේඛනයට අනුව පහත උපලේඛනයේ සඳහන් වැය ශීර්ෂයන්හි ප්‍රතිපාදන ඉදිරියට ප්‍රමාණවත් නොවන බැවින් මෙම වර්ෂයේ තවදුරටත් ඉටු කළ යුතු කාර්යයන් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන එම උප ලේඛනයේ ඊට ඉදිරියෙන් දක්වා ඇති වැය ශීර්ෂයෙන් මාරු කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

| ප්‍රතිපාදන අවශ්‍ය වැය ශීර්ෂය | **2018** වර්ෂයට වෙන් කර තිබු ප්‍රතිපාදන මුදල රු. | තවදුරටත් වෙන් කළ යුතු ප්‍රතිපාදන මුදල රු. | ප්‍රතිපාදන ලබා ගන්නා වැය ශීර්ෂය | ලබා ගන්නා ප්‍රතිපාදන මුදල රු. | ප්‍රතිපාදන ලබා ගන්නා වැය ශීර්ෂයේ තවදුරටත් ඉතිරි වන මුදල රු. |
|---|---|---|---|---|---|
| **103(2)** ඉන්ධන හා ස්නේහක තෙල් | **790,000.00** | **300,000.00** | **102(2)** විදේශ ගමන් වියදම් | **300,000.00** | **300,000.00** |
| **105(6)**- පුහුණුවැඩසටහන් | **400,000.00** | **50,000.00** | **101(9)1** වෙනත් දීමනා | **50,000.00** | **572,825.75** |
| **105(8)**- මුද්‍රණ සේවා පුවත්පත් දැන්වීම් | **600,000.00** | **385,000.00** | **304(1)** වාහන යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | **385,000.00** | **1,410,203.77** |
| **107(1)**-දුම්රිය ගමන් බලපත්‍ර | **70,000.00** | **20,000.00** | **101(9)1** වෙනත් දීමනා | **20,000.00** | **552,825.75** |
| **203(2)** ඉන්ධන හා ස්නේහක තෙල් | **1,632,000.00** | **900,000.00** | **204(1)** වාහන යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | **900,000.00** | **756,542.71** |
| **303(2)** ඉන්ධන හා ස්නේහක තෙල් | **1,307,000.00** | **550,000.00** | **205(7)** ඩෙංගු මර්ධන | **550,000.00** | **1,272,725.00** |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ව්‍යාපෘතිය | | |
| **304(2) -** ගොඩනැගිලි අළුත්වැඩියා නඩත්තු | **455,000.00** | **196,000.00** | **304(1)** වාහන යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | **196,000.00** | **1,214,203.77** |
| **304(4)-** මංමාවත්, පාලම්, බෝක්කු, අළුත්වැඩියාව | **22,500,000.00** | **11,621,000.00** | **101(7)** මන්ත්‍රී දීමනා | **2,160,000.00** | **1,305,000.00** |
| | | | **101(9)1** වෙනත් දීමනා | **230,000.00** | **322,825.75** |
| | | | **101(9)3** දේපළ තහනම් නිලධාරි දීමනා | **50,000.00** | **286,550.00** |
| | | | **101(9)4** මන්ත්‍රී කමිටු දීමනා | **800,000.00** | **133,500.00** |
| | | | **101(9)5** මන්ත්‍රී ගමන් වියදම් දීමනා | **300,000.00** | **359,000.00** |
| | | | **103(6)** සංග්‍රහ | **500,000.00** | **591,575.00** |
| | | | **104(1)** වාහන යන්ත්‍ර සූත්‍ර හා උපකරණ නඩත්තු | **2,000,000.00** | **1,037,022.67** |
| | | | **205(7)** ඩෙංගු මර්ධන ව්‍යාපෘතිය | **160,000.00** | **1,112,725.00** |
| | | | **304(1)** වාහන යන්ත්‍ර සූත්‍ර හා උපකරණ නඩත්තු | **600,000.00** | **614,203.77** |
| | | | **305(9)2** ප්‍රිමික්ස් ව්‍යාපෘතිය | **3,300,000.00** | **4,501,847.00** |
| | | | **503(8)** වෙනත් ගබඩා භාණ්ඩ | **1,000,000.00** | **184,888.00** |
| | | | **505(8)-** දිවාසුරකුම් ව්‍යාපෘතිය | **521,000.00** | **563,000.00** |
| | | | | **11,621,000.00** | |
| **503(2)** ඉන්ධන හා ස්නේහක තෙල් | **170,000.00** | **100,000.00** | **304(1)** වාහන යන්ත්‍ර සූත්‍ර හා උපකරණ නඩත්තු | **100,000.00** | **514,203.77** |
| **505(6)** විදුලිය සම්බන්ධ වෙනත් සේවා | **300,000.00** | **400,000.00** | **605(4)** පෙරපාසල් ව්‍යාපෘතිය | **400,000.00** | **417,700.00** |
| **604(2)-** ගොඩනැගිලි නඩත්තු | **2,400,000.00** | **778,000.00** | **504(2)-** ගොඩනැගිලි නඩත්තු | **778,000.00** | **1,840,245.74** |
| **607(2)** සුභසාධක ගෙවීම් | **3,250,000.00** | **250,000.00** | **101(9)3** දේපළ තහනම් නිලධාරි දීමනා | **250,000.00** | **36,550.00** |
| **609(4)-** ගොඩනැගිලි- | **1,150,000** | **1,005,000.00** | **309(3)** ගොඩනැගිලි හා | **1,005,000.00** | **1,795,000.00** |

| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන | | | වාහන මිලදී ගැනීම | | |
| | | **16,555,000.00** | | **16,555,000.00** | |

**05 – (06) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.**

**සීතාවක ප්‍රාදේශීය සභාව සඳහා තිරසර සංවර්ධන අරමුණු අන්තර්ගත කරමින් 2018 – 2021 දක්වා වූ වර්ෂයන්ට අදාලව සකස් කරන ලද සංයුක්ත සැලැස්ම සභාව විසින් පිළි ගත යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.**

**05 – (07) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.**

**සීතාවක ප්‍රාදේශීය සභා ක්‍රියාත්මක බලධාරිත්වය ලෙස නම් කර 2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති පළාත් සභා, විමධ්‍යගත, 3/84 ආදායම් ශිර්ෂය හා ඊට අදාල වියදම් ශිර්ෂය වන 309 (2) වැය ශීර්ෂය පාදක කොට ගෙන ආදායම් වියදම් සඳහා වූ පරිපූරක ඇස්තමේන්තුව මෙම යෝජනාවේ කොටසක් වශයෙන් සැලකිය යුතු බවත්, එය 2018 වර්ෂය සඳහා වූ 2 වන පරිපූරක ආදායම් වියදම් ඇස්තමේන්තුව වශයෙන් පිළිගත යුතු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.**

උපලේඛනය

| අනු අංකය | ලිපි ගොනු අංකය | ව්‍යාපෘති නාමය | ලැබීම් (රු.) | අනු අංකය | ව්‍යාපෘති නාමය | ගෙවීම් (රු.) |
|---|---|---|---|---|---|---|
| **1** | **සීප්‍රාස3/2/පනි/2018/15** | පාදුක්ක ප්‍රා.ලේ. කොට්ඨාසයේ දඹෝර දංගහකුඹුර මාර්ගයේ කැඩී ඇති බෝක්කුව අළුතින් සංවර්ධනය කිරීම | **1,000,000.00** | **1** | පාදුක්ක ප්‍රා.ලේ. කොට්ඨාසයේ දඹෝර දංගහකුඹුර මාර්ගයේ කැඩී ඇති බෝක්කුව අළුතින් සංවර්ධනය කිරීම | **1,000,000.00** |
| **2** | **සීප්‍රාස 3/2/පස/2018/16** | සීතාවක ප්‍රා.ලේ කොට්ඨාසයේ ඇස්වත්ත නැගෙනහිර කන්ද පාර පොදු මාර්ගය සංවර්ධනය කිරීම | **100,000.00** | **2** | සීතාවක ප්‍රා.ලේ කොට්ඨාසයේ ඇස්වත්ත නැගෙනහිර කන්ද පාර පොදු මාර්ගය සංවර්ධනය කිරීම | **100,000.00** |
| **3** | **සීප්‍රාස 3/2/පස/2018/17** | සීතාවක ප්‍රා.ලේ කොට්ඨාසයේ කොස්ගම ප්‍රිමා පොදු මාර්ගය සංවර්ධනය කිරීම | **500,000.00** | **3** | සීතාවක ප්‍රා.ලේ කොට්ඨාසයේ කොස්ගම ප්‍රිමා පොදු මාර්ගය සංවර්ධනය කිරීම | **500,000.00** |
| **4** | **සීප්‍රාස 3/2/පස/2018/18** | පාදුක්ක ප්‍රා.ලේ කොට්ඨාසයේ අරුක්වත්ත ගෝල පාර පොදු මාර්ගය සංවර්ධනය කිරීම | **500,000.00** | **4** | පාදුක්ක ප්‍රා.ලේ කොට්ඨාසයේ අරුක්වත්ත ගෝල පාර පොදු මාර්ගය සංවර්ධනය කිරීම | **500,000.00** |
| **5** | **සීප්‍රාස 3/2/පස/2018/19** | සීතාවක ප්‍රා.ලේ කොට්ඨාසයේ ඇස්වත්ත ප්‍රගතිපුර පොදු මාර්ගය සංවර්ධනය කිරීම | **500,000.00** | **5** | සීතාවක ප්‍රා.ලේ කොට්ඨාසයේ ඇස්වත්ත ප්‍රගතිපුර පොදු මාර්ගය සංවර්ධනය කිරීම | **500,000.00** |
| **6** | **සීප්‍රාස 3/2/පස/2018/20** | සීතාවක ප්‍රා.ලේ කොට්ඨාසයේ ඇස්වත්ත ඉසුරු මාවත පොදු මාර්ගය සංවර්ධනය කිරීම | **500,000.00** | **6** | සීතාවක ප්‍රා.ලේ කොට්ඨාසයේ ඇස්වත්ත ඉසුරු මාවත පොදු මාර්ගය සංවර්ධනය කිරීම | **500,000.00** |
| **7** | **සීප්‍රාස 3/2/පස/2018/21** | සීතාවක ප්‍රා.ලේ කොට්ඨාසයේ ඇස්වත්ත සීවලි වෙත්තසිංහ පොදු මාර්ගය සංවර්ධනය කිරීම | **500,000.00** | **7** | සීතාවක ප්‍රා.ලේ කොට්ඨාසයේ ඇස්වත්ත සීවලි වෙත්තසිංහ පොදු මාර්ගය සංවර්ධනය කිරීම | **500,000.00** |
| **8** | **සීප්‍රාස 3/2/පස/2018/22** | සීතාවක ප්‍රා.ලේ කොට්ඨාසයේ කොස්වත්ත ඉලුක්ඕවිට දිගන පොදු මාර්ගය සංවර්ධනය කිරීම | **1,000,000.00** | **8** | සීතාවක ප්‍රා.ලේ කොට්ඨාසයේ කොස්වත්ත ඉලුක්ඕවිට දිගන පොදු මාර්ගය සංවර්ධනය කිරීම | **1,000,000.00** |
| **9** | **සීප්‍රාස 3/2/පස/2018/23** | සීතාවක ප්‍රා.ලේ කොට්ඨාසයේ ඇස්වත්ත පොදු පළමු පටුමඟ සංවර්ධනය කිරීම | **300,000.00** | **9** | සීතාවක ප්‍රා.ලේ කොට්ඨාසයේ ඇස්වත්ත පොදු පළමු පටුමඟ සංවර්ධනය කිරීම | **300,000.00** |
| **10** | **සීප්‍රාස 3/2/පස/2018/24** | සීතාවක ප්‍රා.ලේ කොට්ඨාසයේ මීගහවත්ත පොදු මාර්ගය | **500,000.00** | **10** | සීතාවක ප්‍රා.ලේ කොට්ඨාසයේ මීගහවත්ත පොදු මාර්ගය | **500,000.00** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | සංවර්ධනය කිරීම | | | සංවර්ධනය කිරීම | |
| 11 | සීප්‍රාස 3/2/පස/2018/25 | සීතාවක ප්‍රා.ලේ කොට්ඨාසයේ නිරිපොළ 438 ග්‍රා.නි. වසමේ නිරිපොළ සදාසරණ මාවත පොදු මාර්ගය සංවර්ධනය කිරීම | 300,000.00 | 11 | සීතාවක ප්‍රා.ලේ කොට්ඨාසයේ නිරිපොළ 438 ග්‍රා.නි. වසමේ නිරිපොළ සදාසරණ මාවත පොදු මාර්ගය සංවර්ධනය කිරීම | 300,000.00 |
| 12 | සීප්‍රාස/3/2/උපා/2018/10 | සීතාවක ප්‍රා.ලේ කොට්ඨාසයේ කඩුගොඩ දකුණ ෂෙල්ටන් ගොඩමුණේ මහතාගේ නිවස අසල රජයේ ඉඩමේ පිහිටි පොදු ළිද සංවර්ධනය කිරීම | 100,000.00 | 12 | සීතාවක ප්‍රා.ලේ කොට්ඨාසයේ කඩුගොඩ දකුණ ෂෙල්ටන් ගොඩමුණේ මහතාගේ නිවස අසල රජයේ ඉඩමේ පිහිටි පොදු ළිද සංවර්ධනය කිරීම | 100,000.00 |
| 13 | සීප්‍රාස 3/2ග්‍රාමා1000/2018/03 | කුඩළුවිල මැණිකේ මහත්මියගෙන් නිවස අසල මාර්ගය කාණු පද්ධතිය සමඟ සංවර්ධනය කිරීම | 1,007,720.59 | 13 | කුඩළුවිල මැණිකේ මහත්මියගෙන් නිවස අසල මාර්ගය කාණු පද්ධතිය සමඟ සංවර්ධනය කිරීම | 1,007,720.59 |
| 14 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/04 | ජනකාන්ත මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීම | 717,837.40 | 14 | ජනකාන්ත මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීම | 717,837.40 |
| 15 | සීප්‍රාස /3/2/ග්‍රාමා1000/2018/05 | විජේන්ද්‍ර මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීම | 720,137.40 | 15 | විජේන්ද්‍ර මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීම | 720,137.40 |
| 16 | සීප්‍රාස /3/2/ග්‍රාමා1000/2018/06 | නුවන්සිරි මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීම | 911,680.92 | 16 | නුවන්සිරි මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීම | 911,680.92 |
| 17 | සීප්‍රාස /3/2/ග්‍රාමා1000/2018/07 | ජීවන්ත මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීම | 462,769.45 | 17 | ජීවන්ත මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීම | 462,769.45 |
| 18 | සීප්‍රාස /3/2ග්‍රාමා1000/2018/08 | නිමල් මහතාගේ කඩය අසල මාර්ගය සංවර්ධනය කිරීම | 925,490.97 | 18 | නිමල් මහතාගේ කඩය අසල මාර්ගය සංවර්ධනය කිරීම | 925,490.97 |
| 19 | සීප්‍රාස /3/2/ග්‍රාමා1000/2018/09 | මහින්ද මහතාගේ කඩය අසල මාර්ගය සංවර්ධනය කිරීම | 727,083.40 | 19 | මහින්ද මහතාගේ කඩය අසල මාර්ගය සංවර්ධනය කිරීම | 727,083.40 |
| 20 | සීප්‍රාස /3/2/ග්‍රාමා1000/2018/10 | කුඩළුවිල ලක්ෂ්මන් මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීම | 575,553.77 | 20 | කුඩළුවිල ලක්ෂ්මන් මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීම | 575,553.77 |
| 21 | සීප්‍රාස /3/2ග්‍රාමා1000/2018/11 | ෆැන්ටසි දෙවන පටුමග සංවර්ධනය කිරීම | 563,260.25 | 21 | ෆැන්ටසි දෙවන පටුමග සංවර්ධනය කිරීම | 563,260.25 |
| 22 | සීප්‍රාස /3/2ග්‍රාමා1000/2018/12 | අරුක්වත්ත පළමු පටුමග ප්‍රධාන පාරෙන් ග්‍රීන් ටෙරස් දෙසට අබලන්ව ඇති කොටස සංවර්ධනය කිරීම | 2,654,872.29 | 22 | අරුක්වත්ත පළමු පටුමග ප්‍රධාන පාරෙන් ග්‍රීන් ටෙරස් දෙසට අබලන්ව ඇති කොටස සංවර්ධනය කිරීම | 2,654,872.29 |
| 23 | සීප්‍රාස /3/2/ග්‍රාමා1000/2018/13 | හයිලෙවල් මාර්ගයේ අතුරු මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම | 1,124,366.58 | 23 | හයිලෙවල් මාර්ගයේ අතුරු මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම | 1,124,366.58 |
| 24 | සීප්‍රාස /3/2ග්‍රාමා1000/2018/14 | හංවැල්ල පළමු පටුමග මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම | 575,000.00 | 24 | හංවැල්ල පළමු පටුමග මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම | 575,000.00 |
| 25 | සීප්‍රාස /3/2/ග්‍රාමා1000/2018/15 | මීගහවත්ත පළමු පටුමග මාර්ගය සංවර්ධනය කිරීම | 426,335.70 | 25 | මීගහවත්ත පළමු පටුමග මාර්ගය සංවර්ධනය කිරීම | 426,335.70 |
| 26 | සීප්‍රාස /3/2ග්‍රාමා1000/2018/16 | රජයේ සම්භාණ්ඩ පුහුණු මධ්‍යස්ථානය ඉදිරිපිට මාර්ගය සංවර්ධනය කිරීම | 1,081,204.91 | 26 | රජයේ සම්භාණ්ඩ පුහුණු මධ්‍යස්ථානය ඉදිරිපිට මාර්ගය සංවර්ධනය කිරීම | 1,081,204.91 |
| 27 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/17 | වැලිකන්න ජපමාල මාර්ගය සංවර්ධනය කිරීම | 999,885.26 | 27 | වැලිකන්න ජපමාල මාර්ගය සංවර්ධනය කිරීම | 999,885.26 |
| 28 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/18 | මීපිලාව මාර්ගය සංවර්ධනය කිරීම | 2,016,248.33 | 28 | මීපිලාව මාර්ගය සංවර්ධනය කිරීම | 2,016,248.33 |
| 29 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/20 | ඩේල් නිවස සංකීර්ණය 2 වන පටුමග මාර්ගය සංවර්ධනය කිරීම | 903,841.86 | 29 | ඩේල් නිවස සංකීර්ණය 2 වන පටුමග මාර්ගය සංවර්ධනය කිරීම | 903,841.86 |
| 30 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/21 | 452 ගලගෙදර උතුර ග්‍රාම සේවා වසමේ හසන් මහතාගේ නිවස අසල සිට ඉදිරියට මාර්ගය සංවර්ධනය කිරීම | 715,291.82 | 30 | 452 ගලගෙදර උතුර ග්‍රාම සේවා වසමේ හසන් මහතාගේ නිවස අසල සිට ඉදිරියට මාර්ගය සංවර්ධනය කිරීම | 715,291.82 |
| 31 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/22 | පාදුක්ක මීපේ ප්‍රධාන මාර්ගයට මුහුණලා කොටිගහලේන මාර්ගය සංවර්ධනය කිරීම | 844,827.03 | 31 | පාදුක්ක මීපේ ප්‍රධාන මාර්ගයට මුහුණලා කොටිගහලේන මාර්ගය සංවර්ධනය කිරීම | 844,827.03 |
| 32 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/23 | වේරගල හොරකන්ද මාර්ගය සංවර්ධනය කිරීම | 828,406.46 | 32 | වේරගල හොරකන්ද මාර්ගය සංවර්ධනය කිරීම. | 828,406.46 |
| 33 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/24 | බෝපේ සමගි මාවත කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම | 563,529.62 | 33 | බෝපේ සමගි මාවත කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම. | 563,529.62 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 34 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/25 | මුරුතගහහේන මාර්ගය සංවර්ධනය කිරීම | 750,002.63 | 34 | මුරුතගහහේන මාර්ගය සංවර්ධනය කිරීම | 750,002.63 |
| 35 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/26 | මීරියගල්ල කන්දබොඩ මාර්ගය සංවර්ධනය කිරීම | 2,369,472.02 | 35 | මීරියගල්ල කන්දබොඩ මාර්ගය සංවර්ධනය කිරීම | 2,369,472.02 |
| 36 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/27 | හංවැල්ල සිතුමිණ මාර්ගය සංවර්ධනය කිරීම | 542,868.80 | 36 | හංවැල්ල සිතුමිණ මාර්ගය සංවර්ධනය කිරීම | 542,868.80 |
| 37 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/28 | මහවලදෙණිය කනත්ත පාර සංවර්ධනය කිරීම | 1,285,216.13 | 37 | මහවලදෙණිය කනත්ත පාර සංවර්ධනය කිරීම | 1,285,216.13 |
| 38 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/29 | හංවැල්ල රාජසිංහ මාවත සංවර්ධනය කිරීම | 1,052,393.08 | 38 | හංවැල්ල රාජසිංහ මාවත සංවර්ධනය කිරීම | 1,052,393.08 |
| 39 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/30 | අරුක්වත්ත ජයනන්ද මාර්ගය සංවර්ධනය කිරීම | 1,295,247.76 | 39 | අරුක්වත්ත ජයනන්ද මාර්ගය සංවර්ධනය කිරීම | 1,295,247.76 |
| 40 | සීප්‍ර 3/2/ග්‍රාමා1000/2018/31 | ආනන්දගම බේකරිය ඉදිරිපිට අතුරු මාර්ගය සංවර්ධනය කිරීම. | 345,656.88 | 40 | ආනන්දගම බේකරිය ඉදිරිපිට අතුරු මාර්ගය සංවර්ධනය කිරීම. | 345,656.88 |
| 41 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/32 | ආනන්දගම ලක්සිරි මහතාගේ නිවස අසලින් යන මාර්ගය සංවර්ධනය කිරීම. | 153,357.16 | 41 | ආනන්දගම ලක්සිරි මහතාගේ නිවස අසලින් යන මාර්ගය සංවර්ධනය කිරීම. | 153,357.16 |
| 42 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/33 | පාදුක්ක ජයන්ති මාවත, ජයන්තිපුර අතුරු මාර්ගය සංවර්ධනය කිරීම. | 648,548.93 | 42 | පාදුක්ක ජයන්ති මාවත, ජයන්තිපුර අතුරු මාර්ගය සංවර්ධනය කිරීම. | 648,548.93 |
| 43 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/34 | පාදුක්ක මැල්වත්ත 2 පටුමග කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම. | 573,315.66 | 43 | පාදුක්ක මැල්වත්ත 2 පටුමග කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම. | 573,315.66 |
| 44 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/35 | බෝපේ සියඹලාව පාරේ බටලන්ද පෙදෙස මාර්ගය සංවර්ධනය කිරීම. | 565,949.10 | 44 | බෝපේ සියඹලාව පාරේ බටලන්ද පෙදෙස මාර්ගය සංවර්ධනය කිරීම. | 565,949.10 |
| 45 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/36 | අංගමුව රණවිරු මාර්ගය සංවර්ධනය කිරීම | 746,161.42 | 45 | අංගමුව රණවිරු මාර්ගය සංවර්ධනය කිරීම | 746,161.42 |
| 46 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/37 | මාවල්ගම රේමන්ඩ් ලී මෝල අසල මාර්ගය සංවර්ධනය කිරීම. | 551,959.54 | 46 | මාවල්ගම රේමන්ඩ් ලී මෝල අසල මාර්ගය සංවර්ධනය කිරීම. | 551,959.54 |
| 47 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/38 | කළුඅග්ගල මුණමලේවත්ත අභ්‍යන්තර මාර්ගය සංවර්ධනය කිරීම. | 633,764.86 | 47 | කළුඅග්ගල මුණමලේවත්ත අභ්‍යන්තර මාර්ගය සංවර්ධනය කිරීම. | 633,764.86 |
| 48 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/39 | කොස්ගම බදුවත්ත මාර්ගය සංවර්ධනය කිරීම | 346,128.74 | 48 | කොස්ගම බදුවත්ත මාර්ගය සංවර්ධනය කිරීම | 346,128.74 |
| 49 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/40 | කොස්ගම කම්බිකොටුව මාර්ගය සංවර්ධනය කිරීම. | 685,087.36 | 49 | කොස්ගම කම්බිකොටුව මාර්ගය සංවර්ධනය කිරීම. | 685,087.36 |
| 50 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/41 | දිගන මීනුවන්විල මාර්ගය සංවර්ධනය කිරීම. | 550,014.77 | 50 | දිගන මීනුවන්විල මාර්ගය සංවර්ධනය කිරීම. | 550,014.77 |
| 51 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/42 | දිද්දෙනිය කම්මල්වත්ත මාර්ගය සංවර්ධනය කිරීම. | 593,193.35 | 51 | දිද්දෙනිය කම්මල්වත්ත මාර්ගය සංවර්ධනය කිරීම. | 593,193.35 |
| 52 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/43 | නිරිපොල දෙහිගහහේන අතුරු මාර්ගය සංවර්ධනය කිරීම. | 646,404.44 | 52 | නිරිපොල දෙහිගහහේන අතුරු මාර්ගය සංවර්ධනය කිරීම. | 646,404.44 |
| 53 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/44 | බොල්ලතාව පිලප්පු කන්ද මාර්ගය සංවර්ධනය කිරීම. | 440,398.15 | 53 | බොල්ලතාව පිලප්පු කන්ද මාර්ගය සංවර්ධනය කිරීම. | 440,398.15 |
| 54 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/45 | බොල්ලතාව ශ්‍රී සුගත යෝගාශ්‍රමය මාර්ගය සංවර්ධනය කිරීම. | 730,262.93 | 54 | බොල්ලතාව ශ්‍රී සුගත යෝගාශ්‍රමය මාර්ගය සංවර්ධනය කිරීම. | 730,262.93 |
| 55 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/47 | කොස්ගම සර්වෝදය මාවතේ වැව අසල ජල ටැංකිය හරස් මාර්ගය සංවර්ධනය කිරීම. | 620,077.05 | 55 | කොස්ගම සර්වෝදය මාවතේ වැව අසල ජල ටැංකිය හරස් මාර්ගය සංවර්ධනය කිරීම. | 620,077.05 |
| 56 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/48 | සාලාව හමුදා කඳවුර ඉදිරිපිට මාර්ගය සංවර්ධනය කිරීම. | 369,996.47 | 56 | සාලාව හමුදා කඳවුර ඉදිරිපිට මාර්ගය සංවර්ධනය කිරීම. | 369,996.47 |
| 57 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/49 | කඩුගොඩ අරපංගම මාර්ගය සංවර්ධනය කිරීම. | 545,467.24 | 57 | කඩුගොඩ අරපංගම මාර්ගය සංවර්ධනය කිරීම. | 545,467.24 |
| 58 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/50 | කොස්ගම නිසල උයන, වෙන්දේසි වත්ත මාර්ගය සංවර්ධනය කිරීම. | 541,493.92 | 58 | කොස්ගම නිසල උයන, වෙන්දේසි වත්ත මාර්ගය සංවර්ධනය කිරීම. | 541,493.92 |
| 59 | සීප්‍රාස3/2/ග්‍රාමා1000/2018/51 | සාලාව, බොරළුගොඩ, මාවල්ගම මාර්ගයේ අතුරු මාර්ගය සංවර්ධනය කිරීම. | 478,571.24 | 59 | සාලාව, බොරළුගොඩ, මාවල්ගම මාර්ගයේ අතුරු මාර්ගය සංවර්ධනය කිරීම. | 478,571.24 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 60 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/52 | රණවිරුගම නිශාන්ත මහතාගේ නිවස අසලින් යන මාර්ගය සංවර්ධනය කිරීම. | 312,358.71 | 60 | රණවිරුගම නිශාන්ත මහතාගේ නිවස අසලින් යන මාර්ගය සංවර්ධනය කිරීම. | 312,358.71 |
| 61 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/53 | බොරළුගොඩ කහටගහවත්ත මාර්ගය සංවර්ධනය කිරීම. | 473,834.25 | 61 | බොරළුගොඩ කහටගහවත්ත මාර්ගය සංවර්ධනය කිරීම. | 473,834.25 |
| 62 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/54 | කොස්ගම කාවල්ගොඩ හරහා ධර්මග්‍රාමයට පිවිසෙන මාර්ගය සංවර්ධනය කිරීම. | 570,193.64 | 62 | කොස්ගම කාවල්ගොඩ හරහා ධර්මග්‍රාමයට පිවිසෙන මාර්ගය සංවර්ධනය කිරීම. | 570,193.64 |
| 63 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/55 | බොරළුගොඩ මාවල්ගම පාරේ මුතු ආරච්චි මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීම. | 337,628.96 | 63 | බොරළුගොඩ මාවල්ගම පාරේ මුතු ආරච්චි මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීම. | 337,628.96 |
| 64 | සීප්‍රාස /3/2/ග්‍රාමා1000/2018/56 | කොස්ගම බදුවත්ත මාර්ගයට ප්‍රවිශ්ය බෝක්කුව ඉදිකිර මාර්ගය සංවර්ධනය කිරීම. | 584,307.97 | 64 | කොස්ගම බදුවත්ත මාර්ගයට ප්‍රවිශ්ය බෝක්කුව ඉදිකිර මාර්ගය සංවර්ධනය කිරීම. | 584,307.97 |
| 65 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/58 | ඉහළ කොස්ගම රංදෙනිගම අතුරු මාර්ගය සංවර්ධනය කිරීම. | 444,162.14 | 65 | ඉහළ කොස්ගම රංදෙනිගම අතුරු මාර්ගය සංවර්ධනය කිරීම. | 444,162.14 |
| 66 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/59 | 452 ගලගෙදර නැගෙනහිර කොටිගලහේන-නිදහස් මාවත යා කෙරෙන මාර්ගය සංවර්ධනය කිරීම. | 1,047,201.85 | 66 | 452 ගලගෙදර නැගෙනහිර කොටිගලහේන-නිදහස් මාවත යා කෙරෙන මාර්ගය සංවර්ධනය කිරීම. | 1,047,201.85 |
| 67 | සීප්‍රාස /3/2/ග්‍රාමා1000/2018/60 | 452 ගලගෙදර නැගෙනහිර අරුක්වත්ත සිට පාදුක්ක දෙසට මාර්ගය සංවර්ධනය කිරීම. | 141,278.93 | 67 | 452 ගලගෙදර නැගෙනහිර අරුක්වත්ත සිට පාදුක්ක දෙසට මාර්ගය සංවර්ධනය කිරීම. | 141,278.93 |
| 68 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/61 | 452 ගලගෙදර නැගෙනහිර නිදහස් මාවත මොහාන් මහතාගේ නිවස අසල සිට පුස්සැලිඹිය පාළම දෙසට යන මාර්ගය සංවර්ධනය කිරීම. | 334,394.67 | 68 | 452 ගලගෙදර නැගෙනහිර නිදහස් මාවත මොහාන් මහතාගේ නිවස අසල සිට පුස්සැලිඹිය පාළම දෙසට යන මාර්ගය සංවර්ධනය කිරීම. | 334,394.67 |
| 69 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/62 | 452 A ගලගෙදර උතුර පියසේන මාවතේ පාසල් මාවත දෙසට යන මාර්ගයේ අනුර මහාතාගේ නිවස අසල සිට මාර්ගය සංවර්ධනය කිරීම. | 655,201.23 | 69 | 452 A ගලගෙදර උතුර පියසේන මාවතේ පාසල් මාවත දෙසට යන මාර්ගයේ අනුර මහාතාගේ නිවස අසල සිට මාර්ගය සංවර්ධනය කිරීම. | 655,201.23 |
| 70 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/63 | 452 B ගලගෙදර දකුණ මොරටුව කන්ද මාර්ගයේ ආරම්භක ස්ථානය සිට මාර්ගය සංවර්ධනය කිරීම. | 392,825.21 | 70 | 452 B ගලගෙදර දකුණ මොරටුව කන්ද මාර්ගයේ ආරම්භක ස්ථානය සිට මාර්ගය සංවර්ධනය කිරීම. | 392,825.21 |
| 71 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/64 | කුරුසය අසල නිවාස සංකීර්ණයේ පළමු මාර්ගය සංවර්ධනය කිරීම. | 167,392.22 | 71 | කුරුසය අසල නිවාස සංකීර්ණයේ පළමු මාර්ගය සංවර්ධනය කිරීම. | 167,392.22 |
| 72 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/65 | වීරාන් ලැයිමට යන මාර්ගය සංවර්ධනය කිරීම | 376,502.07 | 72 | වීරාන් ලැයිමට යන මාර්ගය සංවර්ධනය කිරීම | 376,502.07 |
| 73 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/66 | අක්කර 100 නිවාස සංකීර්ණයේ කෝවිල අසල උඩ මාර්ගය සංවර්ධනය කිරීම. | 494,208.91 | 73 | අක්කර 100 නිවාස සංකීර්ණයේ කෝවිල අසල උඩ මාර්ගය සංවර්ධනය කිරීම. | 494,208.91 |
| 74 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/67 | අක්කර 100 නිවාස ව්‍යාපෘතිය පළමු මාර්ගය සංවර්ධනය කිරීම | 485,909.06 | 74 | අක්කර 100 නිවාස ව්‍යාපෘතිය පළමු මාර්ගය සංවර්ධනය කිරීම | 485,909.06 |
| 75 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/68 | කුරුසය අසල සිට ඩෝබි ලැයිමට යන මාර්ගය සංවර්ධනය කිරීම | 160,390.52 | 75 | කුරුසය අසල සිට ඩෝබි ලැයිමට යන මාර්ගය සංවර්ධනය කිරීම | 160,390.52 |
| 76 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/69 | එල්ස්ටන් වත්ත අවිස්සාවෙල්ල කොටස (වෙරගොල්ල) තැඹිලි කැල්ලේ මාර්ගය සංවර්ධනය කිරීම | 314,986.62 | 76 | එල්ස්ටන් වත්ත අවිස්සාවෙල්ල කොටස (වෙරගොල්ල) තැඹිලි කැල්ලේ මාර්ගය සංවර්ධනය කිරීම | 314,986.62 |
| 77 | සීප්‍රාස 3/2/ග්‍රාමා1000/2018/70 | සීතාවක තුන්නාන සිට ජයවීරගොඩ දෙසට මාර්ගය කාපට් කර සංවර්ධනය කිරීම | 24,900,000.00 | 77 | සීතාවක තුන්නාන සිට ජයවීරගොඩ දෙසට මාර්ගය කාපට් කර සංවර්ධනය කිරීම | 24,900,000.00 |
| 78 | සීප්‍රාස 3/2/ප්‍රාග්වැ/2018/01 | මුරුතගම සුනිල් තිලකරත්න ප්‍රජා ශාලවේ වැඩ නිම කිරීම | 671,633.06 | 78 | මුරුතගම සුනිල් තිලකරත්න ප්‍රජා ශාලවේ වැඩ නිම කිරීම | 671,633.06 |
| 79 | සීප්‍රාස 3/2/ප්‍රාසශක්වැ/2018/01 | සාලාව ආනන්දගම බෝධිය අසල ඇති කාණුව සංවර්ධනය කිරීම | 257,237.86 | 79 | සාලාව ආනන්දගම බෝධිය අසල ඇති කාණුව සංවර්ධනය කිරීම | 257,237.86 |
| 80 | සීප්‍රාස 3/2/ප්‍රාසශක්වැ/2018/02 | මුරුතගම සණස බැංකුව ඉදිරිපිට පැති කාණුව ඉදිකිරීම | 567,877.95 | 80 | මුරුතගම සණස බැංකුව ඉදිරිපිට පැති කාණුව ඉදිකිරීම | 567,877.95 |
| 81 | සීප්‍රාස 3/2/ප්‍රාසශක්වැ/2018/03 | බොරළුගොඩ ලන්දවත්ත ජල බස්නා කාණුව සංවර්ධනය කිරීම | 161,477.53 | 81 | බොරළුගොඩ ලන්දවත්ත ජල බස්නා කාණුව සංවර්ධනය කිරීම | 161,477.53 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 82 | සීප්‍රාස 3/2/ප්‍රාසශක්වැ/2018/04 | තුන්නාන කෝන්ගහවත්ත පාර බැවුම කොටස කාණුව සංවර්ධනය කිරීම | 1,999,724.21 | 82 | තුන්නාන කෝන්ගහවත්ත පාර බැවුම කොටස කාණුව සංවර්ධනය කිරීම | 1,999,724.21 |
| එකතුව | | | 79,057,081.21 | එකතුව | | 79,057,081.21 |

<u>05 – (08) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදයකුමාර ගමගේ මැතිතුමා විසින් යෝජනා කරයි.</u>

කැළණි නදී නිම්නයේ සීතාවක පුරවරයේ රංවල දෙවියන් පිළිබඳ පවත්නා වූ විශ්වාසය හා ඇදහීම ජන ජීවිතය හා බැඳී පවතින්නක් වන අතර ප්‍රදේශයට ආවේණික වූ සංස්කෘතික උරුමයකි. පුරාතනයේ පටන් රංවල දෙවිඳුන් උදෙසා පූජෝපහාර පිණිස කනම්පැල්ල ශ්‍රී සුමනාරාම විහාරස්ථ රංවල දේවාලයේ ගංගා රෝහණ මහා පෙරහර පිංකම සංවිධානය වී ඇති අතර 2013 ජනවාරි මස 18 වන දින අංක 1794 ගැසට් පත්‍ර යේ පල කිරිමෙන් වන්දනා ගමන් ආඥා පනත යටතේ රජය පිළිගත් පෙරහරක් ලෙස පිළිගෙන ඇත. වර්තමානයේ සීතාවක ප්‍රාදේශීය සභා සීමාව තුළ රජය මගින් පිළිගෙන අනුමත කොට පවත්වන එකම පෙරහර පිංකම වන මෙම පෙරහර පිංකම 2018 වර්ෂයේද දෙසැම්බර් මස 29 හා 30 දෙදින සංවිධානය කර ඇති අතර 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 132 ( ඊ) වගන්තිය යටතේ පැවරි ඇති බලතල අනුව එහි සංවිධාන කටයුතු වෙනුවෙන් සීතාවක ප්‍රාදේශීය සභාවේ පොදු අරමුදලින් රුපියල් ලක්ෂයක මුදලක් ( රු. 100,000.00) වෙන් කොට ලබා දිය යුතු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>05 – (09) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නන්ද කුමාරසිංහ මැතිතුමා විසින් යෝජනා කරයි.</u>

කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර හේවාගම් කෝරලයේ සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 435/ඒ ගිරාඉඹුල ග්‍රාම නිලධාරි වසමේ කහටපිටිය ගිරාඉඹුල පාරෙන් ( බේකරි ගොඩැල්ල පාරෙන්) ආරම්භ වී බී. සෝමවති මහත්මියට අයත් පෞද්ගලික ඉඩමෙන් අවසන් වන දිගින් මීටර් 195 ක් හා පළල මීටර් 3.0 ක් වන ගොඩැල්ල පාරේ පළමු පටුමග සහ ගොඩැල්ල පාරේ පළමු පටු මාවතේ ඇස්.ඒ පොඩි මැණිකේ මහත්මියගේ පෞද්ගලික ඉඩම අසලින් ආරම්භ වී හද්‍රා ස්වර්ණලතා මහත්මියට අයත් පෞද්ගලික ඉඩමෙන් අවසන් වන දිගින් මීටර් 56 ක් හා පළල මීටර් 3.65 ක් වන 1 වන අතුරු පාරත්,

ගොඩැල්ල පාරේ පළමු පටු මාවතේ 1 වන අතුරු පාරේ හද්‍රා ස්වර්ණණලතා මහත්මියට අයත් පෞද්ගලික ඉඩම අසලින් ආරම්භ වී එම්.ඩී. දිපානි මහත්මියට අයත් පෞද්ගලික ඉඩමෙන් අවසන් වන දිගින් මීටර් 45 ක් හා පළල මීටර් 3.0 ක් වන 2 වන අතුරු පාරත්,

ගොඩැල්ල පාරේ පළමු පටු මාවතේ ඩබ්.රත්නසිරි රත්නායක මහතාට අයත් පෞද්ගලික ඉඩම අසලින් ආරම්භ වී එම්.ඩී. නෙවිල් මහතාගේ පෞද්ගලික ඉඩමෙන් අවසන් වන දිගින් මීටර් 17 ක් හා පළල මීටර් 4.57 ක් වන 3 වන අතුරු පාරත්,

ගොඩැල්ල පාරේ පළමු පටු මාවතේ බී. සෝමවතී මහත්මියට අයත් පෞද්ගලික ඉඩමෙන් ආරම්භ වී කේ.ඒ. මල්ලිකා මහත්මියට අයත් පෞද්ගලික ඉඩමෙන් අවසන් වන දිගින් මීටර් 30 ක් හා පළල මීටර් 4.57 ක් වන 4 වන අතුරු පාරත්,

ප්‍රාදේශීය සභාවට පවරාගෙන සංවර්ධනය කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>05 – (10) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඒ ප්‍රදිප් කුමාර් මැතිතුමා විසින් යෝජනා කරයි.</u>

කොළඹ දිස්ත්‍රික්කයේ වුවද ඉතාමත් දුෂ්කර හා අඩුපාඩුකම් සහිත ජනතාවක් වෙසෙන අප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාව රජයේ පාසලකට දරුවන් යොමු කරනුයේ ඇති හැකි නැති බැරි සියළුදෙනාටම සම අධ්‍යාපන අයිතිවාසිකම් ලැබේය යන බලාපොරොත්තුවෙනි. බොහෝ ජනප්‍රිය පාසල් වල තත්වය මෙයට ඉඳුරාම වෙනස් මුහුණුවරක් ගනී.

රජයේ චක්‍රලේඛන කොපමණ පැවතියද ඒවා තඹයකදු මායිම් නොකර දෙමාපියන්ගෙන් ඉතාමත් අසාධාරණ ලෙස මුදල් එකතු කිරිම් දිගින් දිගටම වාර්තා වන අතර එසේ මුදල් දීමට නොහැකි වීම මත දරුවන්ට අඩු සැලකිලි දැක්වීම නිසා දරුවන් අසරණභාවයට පත් වීම කොතෙකුත් වාර්තා වේ.

එම නිසා ප්‍රදේශයේ පවතින පාසල් වලට අවශ්‍ය භෞතික හා මානව සම්පත් ලබා දෙමින් මේවායේ පවතින අඩුපාඩු සකසා අක්‍රමිකතා සිදු කරන නිලධාරින්ට විරුද්ධව අවශ්‍ය පියවර ගෙන ප්‍රදේශයේ දිළිඳු ජනතාවගේ අධ්‍යාපන අයිතිය තහවුරු කරන ලෙසට ගරු අධ්‍යාපන ඇමතිතුමාට, අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්තුමාට, බස්නාහිර පළාත් මහ ඇමතිතුමාට, බස්නාහිර පළාත් අධ්‍යාපන ඇමතිතුමාට, බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකතුමාට, හෝමාගම කලාප අධ්‍යක්ෂකතුමාට දන්වා යවන ලෙස මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**06.කාරක සභා වාර්තා.**

**06 – (01 ) 2018.10.22** නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්විමේ වාර්තාව.

**06 – (02 ) 2018.10.23** පරිසර හා පහසුකම් කාරක සභා රැස්වීමේ වාර්තාව.

**06 – (03 ) 2018.10.25** කාර්මික සේවා කාරක සභා රැස්වීමේ වාර්තාව.

**06 - (04) 2018.10.26** මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා රැස්වීමේ වාර්තාව.

**06 - (05) 2018.10.10** ටෙන්ඩර් මණ්ඩල රැස්වීමේ වාර්තාව.

**06 - (06) 2018.10.18** ටෙන්ඩර් මණ්ඩල රැස්වීමේ වාර්තාව.

**06 - (07) 2018.10.23** ටෙන්ඩර් මණ්ඩල රැස්වීමේ වාර්තාව.

**06 - (08) 2018.10.26** ටෙන්ඩර් මණ්ඩල රැස්වීමේ වාර්තාව.

**06 - (09) 2018.11.01** ටෙන්ඩර් මණ්ඩල රැස්වීමේ වාර්තාව.

**07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ.**

**07 – (01) 2018** සැප්තැම්බර් මාසය ලැබීම් හා වියදම් පිළිබඳ ප්‍රකාශය.

**08.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික ප්‍රකාශ.